වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

# පෙරහුරු පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2024

## භූගෝල විද්‍යාව - I

විභාග අංකය :...................................

කාලය පැය 03

* මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත වේ.

* I කොටස බහුවරණ **ප්‍රශ්න 40කින්** යුක්ත වන අතර, ඒවාට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතු ය.

* II කොටසෙහි ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සැපයිය යුතුය. III කොටස ප්‍රශ්න **හතරකින්** සමන්විත වන අතර තෝරාගත් ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සැපයිය යුතුය.


* මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා මෙට්‍රික් සිතියම් කොටසක් සපයනු ලැබේ.

### I කොටස

01).1:24,000 පරිමාණයේ භූ ලක්ෂණ සිතියම් ශ්‍රේණිය භාවිතා කරන රටක් දැක්වෙන වරණය තෝරන්න.

i. ඇමරිකා එක්සත් ජනපදය
ii. එක්සත් රාජධානිය
iii. ශ්‍රී ලංකාව
iv. කැනඩාව
v. ඉන්දියාව
(.........)

02).




මෙම රූප සටහනේ A ,Bඅක්ෂරවලින් දැක්වෙන ජලවහන ලක්ෂණ දෙක පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

i.ප්‍රධාන ගංගාව, ගං දහරය
ii. අතු ගංගාව, අපශාඛාව
iii. ඩෙල්ටාව, හැඩපළු ලක්ෂණ
iv. ගං දහරය, අතු ගංගාව
v. අපශාඛාව, අතු ගංගාව
(.........)

03).1:50,000 භූ ලක්ෂණ සිතියම්වල තනි වර්ණයකින් නිරූපිත ලක්ෂණ දෙකක් නිවැරදි ව දැක්වෙන පිළිතුර මින් කුමක්ද?

i. රබර් වගාව, වෙනත් වගා
ii. ගෙවතු වගාව, ඉදිකළ ප්‍රදේශය
iii. වී වගාව, තේ වගාව
iv. ගෙවතු වගාව, රබර් වගාව
v. පොල් වගාව, ගෙවතු වගාව
(........)

04).1:50,000 භූ ලක්ෂණ සිතියමක භූ විෂමතා ලක්ෂණ නිරූපණය කරන සංකේත තුනක් නිවැරදි ව සඳහන් පිළිතුර තෝරන්න.

i. සමෝච්ච රේඛා, සම ගැඹුරු රේඛා, ගංගාව
ii. ත්‍රිකෝණමිතික ස්ථානය, තැන් උස, සමෝච්ච රේඛා
iii. තැන් උස, හැඩපළු ලක්ෂණ, අඩි පාර
iv. ත්‍රිකෝණමිතික ස්ථානය, ගංගාව, ඉදිකළ ප්‍රදේශ
v. සමෝච්ච රේඛා, ත්‍රිකෝණමිතික ස්ථානය, ජාතික බණ්ඩාංක
(.........)

05). ශ්‍රී ලංකා භූ ලක්ෂණ සිතියම් වල පරිපාලන බෙදීම් දක්වා ඇත්තේ,

i. පරිපාලන මායිම් හා කඩුවැටි මගිනි.
ii. ගංගාවල පිහිටීම හා ජලාශවල පිහිටීම මගිනි.
iii. පරිපාලන මායිම් හා අක්ෂර වලිනි.
iv. වනාන්තර ව්‍යාප්තිය හා වර්ණ වලිනි.
v. ජනාවාස ලක්ෂණ හා සංකේත වලිනි.
(.........)

06). ගෝලීය ස්ථාන හා කිරීමේ පද්ධතියට (GPS) අදාලව අභ්‍යවකාශයේ රඳවා ඇති චන්ද්‍රිකා අතරින් පද්ධතියේ ක්‍රියාකාරිත්වයට අවම ලෙස දායක වන චන්ද්‍රිකා ගණන දැක්වෙන පිළිතුර තෝරන්න.

i. 06 කි. ii. 07 කි. iii. 22 කි. iv. 24 කි. v. 31 කි. (.........)

07). A. භූගෝලීය දත්ත හා තොරතුරු ගබඩා කිරීම B. දත්ත විශ්ලේෂණය කිරීම
C. සිතියම් නිර්මාණය හා ප්‍රදර්ශනය

භූගෝලීය තොරතුරු පද්ධතියට (GIS) අදාළ ඉහත කාර්යයන් සිදුකරනුයේ,

i. ආදාන උපාංග මගිනි. iii. මුද්‍රණ යන්ත්‍රය මගිනි. v. දෘඩාංග මගිනි. (.........)
ii. මෘදුකාංග මගිනි. iv. ගබඩා උපාංග මගිනි.

08). ආරෝහණ හෝ අවරෝහණ ක්‍රමයට සකස් කරන ලද දත්ත සමූහයක් හඳුන්වනුයේ,

i. සමූහිත සංඛ්‍යාත ව්‍යාප්තිය ලෙස ය. iii. අසමූහිත දත්ත ව්‍යාප්තිය ලෙස ය. v. සන්තතික දත්ත ලෙස ය.(.......)
ii. නියැදිය ලෙස ය. iv. දත්ත වැල ලෙස ය.

09). විවිධ්‍යායන් කිහිපයට අදාළ ව වර්ෂ කිහිපයක දත්ත සමූහයක් නිරූපණයට වඩාත් සුදුසු ප්‍රස්තාරික ක්‍රමවේදය අඩංගු පිළිතුර තෝරන්න.

i. සරල තීරු ප්‍රස්තාරය iii. සංයුක්ත රේඛා ප්‍රස්තාරය v. සැසඳුම් තීරු ප්‍රස්තාරය (.......)
ii. ඡේදිත වෘත්ත ප්‍රස්තාරය iv. පිරමීඩාකාර ප්‍රස්තාරය


10). විසරණ සටහන හා අපගමන ප්‍රස්තාර මගින් නිරූපණය කරනු ලබන්නේ දත්ත ව්‍යාප්තියක,

i. කේන්ද්‍රික ප්‍රවණතාව යි. iii. අපකිරණය යි. v. සමූහිත සංඛ්‍යාත ව්‍යාප්තිය යි.
ii. සමුච්චිත සංඛ්‍යා යි. iv. අසමූහිත දත්ත ව්‍යාප්තිය යි. (.......)

11). ජෛවගෝලයේ පද්ධති අතර ශක්තිය හුවමාරුව දැක්වෙන අවස්ථාවක් වනුයේ,

i. ශාක වර්ධනය iii. පාරිසරික පිරමීඩ v. ජල චක්‍රය (.......)
ii. වායු පීඩන වෙනස්කම් iv. භූමි කම්පා හා භූ චලන

12).




ශිලාගෝලීය පද්ධතිය දැක්වෙන මෙම රූප සටහනේ A හා B අක්ෂර වලින් දැක්වෙනුයේ,

i. සාගරික කබොල හා මහාද්වීපික කබොල යි. iii. මහාද්වීපික කබොල හා අධෝගෝලය යි.
ii. ඉහළ ප්‍රාවරණය හා කොන්රඩ් අසන්තික කලාපය යි. iv. අධෝගෝලය හා ශිලා ගෝලය යි. (.......)
v. ශිලාගෝලය හා මොහොරොවිසික් අසන්තතික යි.

13). වායුගෝලය තුළ උෂ්ණත්වය ස්ථාවර ව පවතින කලාප දෙක පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

i. අපරවර්තීගෝලය, මෙසෝගෝලය iv. අපරවර්තී මණ්ඩලය, අධෝගෝලය
ii. පරිවර්තීගෝලය, අපරවර්තී මණ්ඩලය v. පරිවර්තී මණ්ඩලය, මෙසෝ මණ්ඩලය
iii. පරිවර්තී මණ්ඩලය, මෙසෝගෝලය (.......)

14). පාෂාණවල ඇති විකිරණශීලී මූලද්‍රව්‍ය නිසා පෘථිවි හරය සීමාවේ ඇතැයි සැලකෙන උෂ්ණත්වය වන්නේ,

i. 2000 $^0$C පමණ ය. iii. 15000 $^0$C පමණ ය. v. 6.4 $^0$C පමණ ය.
ii. 6000 $^0$C පමණ ය. iv. 25 $^0$C පමණ ය. (.......)

15). ගංගාවක ප්‍රබල සිරස් සංඝර්ෂණ ක්‍රියාවලිය මගින් නිර්මාණය වන භූ රූපයක් දැක්වෙන වරණය කුමක්ද?

i. ගං දහරය iv. දොරු හා කැනියම (.......)
ii. හැඩපළු ලක්ෂණය v.ගං මළු
iii. නෙත්ති නෙරු

16). ශ්‍රී ලංකාවේ මැග්නටයිට් වර්ගයේ යපස් නිධි ව්‍යාප්ත ව ඇති ප්‍රදේශයක් වනුයේ,

i. කයිකාවල යි. iii. තබ්බෝව යි. v. හම්බන්තොට යි.
ii. විලගෙදර යි. iv. ගාල්ල ඉඳුරුව යි. (.......)

17). අපසාරී තැටි චලන නිසා නිර්මාණය වන භූ ලක්ෂණයක් අඩංගු වන පිළිතුර තෝරන්න.

i. මධ්‍ය අත්ලන්තික් වැටි
ii. ටොංගා ආගාධය
v. අයර් විල
ii. හිමාලය කඳු වැටිය
iv. ටිබෙට් සානුව (.......)

18).ගංගාවක් පරිණත අවස්ථාවේ පසුවන බව හඳුනා ගැනීමට හැකි ලක්ෂණ දෙකක් නිවැරදිව දැක්වෙන පිළිතුර මින් කුමක්ද?

i. දිය ඇල්ල, ගං දඟරය
iii. ගල්වන,ගං මළු
v. ඩෙල්ටාව, දිය ඇල්ල
ii. තියුණු ගං දඟරය, හැඩපළු ලක්ෂණ
iv. ගං දඟරය, ජාලාකාර ජලවහන රටා (.......)

19). පහළ අක්ෂාංශීය නිවර්තන කලාපීය ප්‍රදේශවල දක්නට ලැබෙන වර්ෂණ ක්‍රමයක් දැක්වෙන පිළිතුර තෝරන්න.

i. වර්ෂාපතනය ii. හිමපතනය iii. මීදුම iv. පිනි හෝ තුෂාර v. තුහින (.......)

20). සාමාන්‍ය සුළං සංසරණ ක්‍රියාවලියේ දී ගෝලීය සුළං රටාවල දිශාව තීරණය වීමට බලපාන සාධකයක් වනුයේ,

i. පීඩන අනුක්‍රමණ බලපෑම යි.
iv. පෘථිවියේ අපක්‍රමණ බලවේගය යි.
ii. අන්තර් නිවර්තන අභිසරණ කලාපයේ බලපෑම යි.
v. සුළං අපසරණය යි.
iii. කේන්ද්‍රපසාරී බලවේගය යි. (.......)

21). භූ චලන ක්‍රියාකාරිත්වයේ නැමීම් හා රැළි ගැසීම් හේතුවෙන් නිර්මාණය වන භූ රූපයක් වනුයේ,

i. සාමාන්‍ය විභේදය යි.
ii. සෝපාන විභේදය යි.
iii. සමානති නැම්ම යි.
iv. කුට්ටි විභේදය යි.
v. සෝපාන විභේදය යි. (.......)

22). ශ්‍රී ලංකාවේ මුළු භූමියෙන් 65% ක පමණ ප්‍රමාණයක ව්‍යාප්ත ව ඇති දේශගුණික කලාපය මින් කුමක්ද?

i. පහත රට තෙත් කලාපය
iii. කඳු රට තෙත් කලාපය
v. කඳුරට වියළි කලාපය
ii. පහත රට වියළි කලාපය
iv. අර්ධ ශුෂ්ක කලාපය (.......)

23). දේශගුණික වෙනස්වීම් ඇතිවීමට බලපාන අභ්‍යන්තර හා බාහිර සාධකයක් නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

i. යමහල් ක්‍රියාකාරිත්වය හා සූර්ය ලප
iv. වනහරණය හා පොසිල ඉන්ධන දහනය
ii. සූර්ය ලප හා උල්කාශ්ම
v. හරිතාගාර ආවරණය හා ලානිනා ක්‍රියාකාරිත්වය
iii. එල්නිනෝ හා ලැව් ගිනි (.......)


24). ශ්‍රී ලංකාවේ ඇති ප්‍රධාන ගංගා ද්‍රෝණි සංඛ්‍යාව,

i. 80 කි. ii. 103 කි. iii. 231 කි. iv. 242 කි. v. 263 කි. (.......)

25). පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි අභය භූමියක් වනුයේ,

i. කුමන ii. ආනවිලුන්දාව iii. මන්නාරම iv. වුන්ඩිකුලම් v. ආනමඩුව (.......)

26).



මෙම ජන සංඛ්‍යා පිරමීඩයේ දැකිය හැකි ප්‍රධාන ලක්ෂණයක් වන්නේ,

i. මධ්‍ය වයස් කාණ්ඩවල ජන සංඛ්‍යාව අඩු වීම යි.
ii. සෑම වයස් කණ්ඩායමකම ස්ත්‍රී පුරුෂ ජන සංඛ්‍යාව සමාන වීම යි.
iii. ආයු අපේක්ෂාව ඉහල යාම යි.
iv. පිරමීඩයේ ඉහළ කොටස පටු වීම යි.
v. උපත් අනුපාතිකය ඉතා ඉහළ මට්ටමක පැවතීම යි. (.......)

27). කාර්යයන් අනුව වර්ගීකරණය කිරීමේ දී කඩුවෙල හා ගම්පහ යන නගර ප්‍රධාන වශයෙන් අයත් වන්නේ කුමන වර්ගයකට ද?

i. පරිපාලන නගරය හා වානිජ නගරය
iii. නේවාසික නගරය හා පරිපාලන නගරය
ii. අධ්‍යාපනික නගරය හා සංස්කෘතික නගරය
iv. නේවාසික නගරය හා කාර්මික නගරය
v. කාර්මික නගරය හා අධ්‍යාපනික නගරය (.......)

28). ශ්‍රී ලංකාවෙන් දකුණු කොරියාවට සිදුවන සංක්‍රමණයන් වූ කලී ,

i. නීති විරෝධි සංක්‍රමණයකි.
iv. අධ්‍යාපනය සඳහා සිදුවන විගමනයකි.
ii. ශ්‍රම සංක්‍රමණයකි.
v. ස්ථිර පදිංචිය සඳහා සිදුවන සංක්‍රමණයකි.
iii. බුද්ධි ගලනයකි. (.......)

29). සරණාගත සංක්‍රමණයක දී දැකිය හැකි විශේෂ ලක්ෂණයක් වනුයේ,
i. සාංක්‍රමණික ජනතාව සියලු රටවල් විසින් පිළිගැනීම යි.
ii. නීත්‍යානුකූල සංක්‍රමණ ප්‍රභේදයක් වීම යි.
iii. ගමනාන්තය භූමියෙන් ආසන්න ම රටක් වීම යි.
iv. තනි පුද්ගල සංක්‍රමණයක් සිදුවීම යි.
v. ගමනාන්ත රටවල් සියල්ලම සංවර්ධිත රටවල් වීම යි.
(.......)

30). ලෝකයේ අඩු ම නාගරීකරණයක් සහිත රටවල් දෙකක් දැක්වෙන පිළිතුර වන්නේ,
i. ශ්‍රී ලංකාව, කාම්බෝජය
ii. නේපාලය, මලාවි
iii. දකුණු සුඩානය, නයිජර්
iv. ට්‍රිනිඩෑඩ්, බුරුන්ඩි
v. කාම්බෝජය, කුවේට්
(.......)

31). ශ්‍රී ලංකාවේ 2012 ජන සංගණනයට අනුව ඉහළ ම විගමනයක් සහිත දිස්ත්‍රික්කය කුමක් ද?
i. මහනුවර
ii. වව්නියාව
iii. ගම්පහ
iv. පොළොන්නරුව
v. මොණරාගල
(.......)

32). 1960 දශකයේ සිට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වූ හරිත විප්ලවයේ ප්‍රධානත ම අරමුණ වූයේ,
i. ආහාර අවශ්‍යතාවන් වෙනුවෙන් අස්වැන්න ප්‍රසාරණය යි.
ii. වානිජ කෘෂිකර්මාන්තය නගා සිටුවීම යි.
iii. වියළි කලාපීය මුඩු බිම් අස්වැද්දවීම යි.
iv. බහු ජාතික සමාගම් සමඟ ගිවිසුම් ඇතිකර ගැනීම යි.
v. ජනතාවට රැකියා අවස්ථා සම්පාදනය යි.
(.......)

33). ඌව පළාතට අයත් විශේෂ ආර්ථික මධ්‍යස්ථානයක් දැක්වෙන පිළිතුර මින් කුමක්ද?
i. දඹුල්ල
ii. කැප්පෙටිපොළ
iii. නුවරඑළිය
iv. ඇඹිලිපිටිය
v. මීගොඩ
(.......)

34). ජීන්ගොට්මාන් හා හර්මන් කාන් විසින් හඳුනා ගනු ලැබූ කාර්මික නාගරික වේදිකා දෙක වනුයේ,
i. සැන් සැන් සහ ටොකයිඩෝ නගර යාය
ii. විපිට්ස් සහ සැන් සැන් නගර යාය
iii. බොෂ්වොෂ් සහ විපිට්ස් නගර යාය
iv. විපිට්ස් සහ බොෂ්වොෂ් නගර යාය
v. ටොකයිඩෝ සහ විපිට්ස් නගර යාය
(.......)

35). ගල් අඟුරු ප්‍රධාන වශයෙන් ව්‍යාප්ත ව ඇති වයඹ දිග යුරෝපීය කලාපයට අයත් රටවල් තුනක් අඩංගු පිළිතුර තෝරන්න.
i. තුර්කිය, කසක්ස්ථානය, කොලොම්බියාව
ii. යුක්රේනය, කැනඩාව, ඉතාලිය
iii. ජර්මනිය, පෝලන්තය, චෙක් ජනරජය
iv. කසක්ස්ථානය, චෙක් ජනරජය, තුර්කිය
v. කොලොම්බියාව, ග්‍රීසිය, රුසියාව
(.......)

36). ශ්‍රී ලංකාවේ 'ඇපටයිට් (පොස්පේට්)' නිධිය සොයාගත් වර්ෂය දැක්වෙන වරණය කුමක්ද?
i. 1973 වර්ෂය
ii. 1997 වර්ෂය
iii. 1989 වර්ෂය
iv. 1971 වර්ෂය
v. 1992 වර්ෂය
(.......)

37). ශ්‍රී ලංකාවේ නිශ්පාදන කර්මාන්ත ස්ථාන වීම ප්‍රාදේශීය සංවර්ධනයට දායක වූ අවස්ථාවක් දැක්වෙන පිළිතුර තෝරන්න.
i. ඉහළ අපනයන ආදායමක් ඉපයීම
ii. නිදහස් වෙළෙඳ කලාප හා කර්මාන්ත පුර වැඩසටහන
iii. අපනයන ඉලක්ක කරගත් කර්මාන්තයක් වීම
iv. විශාල ශ්‍රම සංඛ්‍යාවකට රැකියා සැපයීම
v. ශ්‍රී ලංකාවේ ආර්ථිකයට විශාල ශක්තියක් වීම
(.......)

38). දකුණු ආසියාතික රටවල් කලාපය පොදු සංචාරක ගමනාන්තයක් ලෙස සංවර්ධනය කිරීමට කටයුතු කළ සංවිධානය වූයේ,
i. අග්නිදිග ආසියානු සංගමය (ASEAN)
ii. පැසිෆික් ආසියා සංචාරක සංගමය (PATA)
iii. සාර්ක් සංවිධානය (SAARC)
iv. එ.ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානය (UNWTO)
v. දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA)
(.......)

39). ශ්‍රී ලංකාවේ වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර බහුලව ම ව්‍යාප්ත ප්‍රදේශය කුමක්ද?
i. සිංහරාජය
ii. හෝර්ටන් තැන්න
iii. හක්ගල
iv. යාල
v. කන්නෙලිය
(.......)

40). මුළු භූමි ප්‍රමාණය අනුව ශ්‍රී ලංකාවේ විශාලත ම දිස්ත්‍රික්ක දෙක නිවැරදි ව සඳහන් පිළිතුර තෝරන්න.
i. පොළොන්නරුව හා හම්බන්තොට
ii. අනුරාධපුරය හා කුරුණෑගල
iii. අම්පාර හා අනුරාධපුරය
iv. මොණරාගල හා කුරුණෑගල
v. අනුරාධපුරය හා මොණරාගල
(.......)

✸✸✸

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

# පෙරහුරු පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2024

## භූගෝල විද්‍යාව - I

විභාග අංකය :..................................

කාලය පැය 03

* II කොටසෙහි ප්‍රශ්න **දෙකටම** පිළිතුරු සැපයිය යුතුය.

* III කොටස ප්‍රශ්න හතරකින් සමන්විත වන අතර ඉන් තෝරාගත් ප්‍රශ්න **දෙකකට** පිළිතුරු සැපයිය යුතුය.

## II කොටස

1. ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද 1:50,000 පරිමාණයේ භූ ලක්ෂණ සිතියමෙන් කොටසක් ඔබට සපයා ඇත. එහි සමෝච්ච රේඛා අන්තරය මීටර් 100 කි. මෙම සිතියම් පදනම් කර ගනිමින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
   i. A අක්ෂරයෙන් දැක්වෙන්නේ කුමක් ද?
   ii. B අක්ෂරයෙන් දැක්වෙන මායිම නම් කරන්න.
   iii. සිතියම් ප්‍රදේශයේ දක්නට ලැබෙන මාර්ග වර්ග හඳුනාගෙන නම් කරන්න.
   iv. සිතියමේ මුහුදු ප්‍රදේශයේ ඇඳ ඇති රේඛාවන් මොනවාද?
   v. සිතියම් ප්‍රදේශයේ දැකිය හැකි ප්‍රමුඛ ව්‍යාපාරික බෝග වගාව නම් කරන්න.
   vi. C චතුරස්‍රයේ දක්නට ලැබෙන වැව දෙගුණයකින් විශාල කර නැවත අඳින්න.
   vii. සිතියම් ප්‍රදේශයේ ජනාවාස ව්‍යාප්තිය සැකෙවින් විස්තර කරන්න.
   viii. ප්‍රදේශයේ භූමි පරිහරණය කෙරෙහි භූ විෂමතා බලපා ඇති ආකාරය පැහැදිලි කරන්න. (ල.20)

2. සම්මත සංකේත හා වර්ණ යොදාගනිමින් මතු සඳහන් දෑ සපයා ඇති ලෝක ආකෘති සිතියෙමෙහි ලකුණු කර නම් කරන්න.
   1. ඇට්ලස් කඳු
   2. හයිනෑන් දූපත
   3. තාර් කාන්තාරය
   4. බෝෆට් මුහුද
   5. බ්‍රසීල ප්‍රවාහය
   6. කාපෙන්ටේරියා බොක්ක
   7. අමූර් ගංගාව
   8. මොසැම්බික් ඕඩය
   9. OPEC සංවිධානයේ මූලස්ථානය පිහිටි නගරය
   10. 2024 අගෝස්තු මාසයේ රිච්ටර් පරිමාණය 7.1 ක් ලෙස භූමිකම්පාවක් වාර්තා වූ රට (ල.10)

## III කොටස

3. i. දුරස්ථ සංවේද (Remote Sensing) ක්‍රියාවලිය කෙටියෙන් පැහැදිලි කරන්න. ( ල.2 )
   ii. දුරස්ථ සංවේද කටයුතු වලදී දත්ත රැස්කර ගැනීමට දුරස්ථ සංවේද වේදිකා යොදා ගන්නා ආකාරය නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.6 )
   iii. දුරස්ථ සංවේද තාක්ෂණය භාවිතා කළ හැකි ක්ෂේත්‍ර **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. ( ල.4 )
   iv. වර්තමානයේදී නවීන සිතියම් විද්‍යාත්මක ක්‍රමවේද භාවිතය ශීඝ්‍රයෙන් ඉහළ යාමට හේතු වූ සාධක **තුනක්** දක්වන්න. ( ල.3 )

4. i. සංඛ්‍යාන විද්‍යාවේ දී භාවිත කරන දත්ත සංවිධානය කිරීමේ ක්‍රම **දෙකක්** නම් කරන්න. ( ල.4 )

ii. පහත වගුවේ දත්ත භාවිතා කරමින් පංති ප්‍රාන්තරය 480 ලෙස ගෙන සමූහිත සංඛ්‍යාත ව්‍යාප්ති වගුව සකස් කරන්න. (පංති ගණන 5ක් ලෙස සලකන්න.) (ල.5)

**ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අනුව සේවා නියුක්තිය - 2015**

| දිස්ත්‍රික්කය | සේවා නියුක්ති ජන සංඛ්‍යාව | දිස්ත්‍රික්කය | සේවා නියුක්ති ජන සංඛ්‍යාව |
|---|---|---|---|
| කොළඹ | 2553 | රත්නපුර | 1125 |
| ගම්පහ | 2177 | කුරුණෑගල | 1563 |
| කළුතර | 1135 | පුත්තලම | 779 |
| ගාල්ල | 1084 | අනුරාධපුරය | 830 |
| මාතර | 839 | පොළොන්නරුව | 410 |
| හම්බන්තොට | 571 | අම්පාර | 644 |
| බදුල්ල | 886 | මඩකලපුව | 543 |
| මොණරාගල | 440 | ත්‍රිකුණාමලය | 374 |
| මහනුවර | 1431 | යාපනය | 611 |
| මාතලේ | 497 | කිලිනොච්චිය | 156 |
| නුවර එළිය | 761 | මන්නාරම | 104 |
| කෑගල්ල | 818 | මුලතිව් | 148 |
| | | වව්නියාව | 174 |

මූලාශ්‍රය- සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව (කල්පිත) 2015

iii. සමූහිත සංඛ්‍යා ව්‍යාප්ති වගුවක දත්ත භාවිතා කරමින් නිර්මාණය කළ හැකි ප්‍රස්තාර **දෙකක්** පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.4)

iv. දත්ත සංවිධානය කිරීමේ ප්‍රයෝජන **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ල.4)

5. i. අපකිරණ මිණුම් ක්‍රම **හතරක්** නම් කරන්න. (ල.2 )

ii. පහත දත්ත වගුව භාවිතයෙන්

a. මධ්‍යන්‍ය අපගමනය ගණනය කරන්න. (ල.3)

b. අපගමන ප්‍රස්තාරය නිර්මාණය කරන්න. (ල.7)

**ශ්‍රී ලංකාවෙන් මැදපෙරදිග කලාපයට තේ අපනයන ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්) 2010**

| රට | තේ ප්‍රමාණය Kg දහස් | රට | තේ ප්‍රමාණය Kg දහස් |
|---|---|---|---|
| ඊජිප්තුව | 1309 | සිරියාව | 27186 |
| ඉරාකය | 13899 | සවුදි අරාබිය | 4606 |
| ඉරානය | 28675 | තුර්කිය | 19032 |
| ඊශ්‍රායලය | 1648 | එක්සත් අරාබි එමීර් | 30201 |
| ජෝර්දානය | 17620 | යේමනය | 83 |
| කුවේට් | 11470 | කටාර් | 2402 |

මූලාශ්‍රය - සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

iii. ඉහත නිර්මාණය කළ අපගමන ප්‍රස්තාරය ඇසුරින් ශ්‍රී ලංකාවේ තේ අපනයනයේ දැකිය හැකි ප්‍රවණතා **තුනක්** ලියන්න. (ල.3)

6. වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්) 1996 – 2002 පහත වගුවේ දැක්වේ.

වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්) 1996 – 2002

| වර්ෂය | වෙරළාසන්න මත්ස්‍ය නිෂ්පාදනය | ගැඹුරු වෙරළ මත්ස්‍ය නිෂ්පාදනය | අභ්‍යන්තර ජලජීව වගාව |
|---|---|---|---|
| 1996 | 149300 | 57000 | 22250 |
| 1997 | 152750 | 62000 | 27250 |
| 1998 | 166700 | 73250 | 29900 |
| 1999 | 171980 | 76500 | 31450 |
| 2000 | 183280 | 84400 | 36700 |
| 2001 | 167530 | 87360 | 29870 |
| 2002 | 176250 | 98510 | 28130 |

මූලාශ්‍රය - ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය

i.ඉහත වගුවේ සපයා ඇති දත්ත නිරූපණය සඳහා බහුරේඛා ප්‍රස්තාරයක් නිර්මාණය කරන්න. (ල.6)

ii.ඔබ නිර්මාණය කරන ලද ප්‍රස්තාර පදනම් කරගෙන ශ්‍රී ලංකාවේ මත්ස්‍ය නිෂ්පාදනයේ කාලීන වෙනස්කම් **තුනක්** දක්වන්න. (ල.3)

iii. ඉහත වගුවෙහි දත්ත නිරූපණය සඳහා භාවිතා කල හැකි වෙනත් ප්‍රස්තාරික ක්‍රමයක නිර්මාණය කිරීමේ පියවර පැහැදිලි කරන්න. (ල.6)

***

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

# පෙරහුරු පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2024

## භූගෝල විද්‍යාව - II

**විභාග අංකය :..................................** **කාලය පැය 03**

* I හා II කොටස්වලින් ප්‍රශ්න 02 බැගින්වත් තෝරා ගෙන **ප්‍රශ්න 05**කට පිළිතුරු සපයන්න.

### I කොටස - භෞතික භූගෝල විද්‍යාව

1). i. පැසිෆික් සාගරික තැටියට අයත් සුළු තැටි **දෙකක්** නම් කරන්න. (ල.2)

ii. භූ තැටි මායිම් ආශ්‍රිතව සිදුවන ක්‍රියාකාරිත්වයන් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.6)

iii. තිරස් චලන ආශ්‍රිතව නිර්මාණය වන නැමි **තුනක** නිර්මාණාත්මක ක්‍රියාවලිය රූප සටහන් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.6)

iv. තැටි චලන නිසා ඇතිවන බලපෑම් **තුනක්** නිදසුන් ඇසුරින් සාකච්ඡා කරන්න. (ල.6)

2). i. ලෝකයේ ඉහළ අක්ෂාංශීය ප්‍රදේශවල ග්ලැසියර් පිහිටි ප්‍රදේශ **හතරක්** නම් කරන්න. (ල.2)

ii. මහාද්වීපික ග්ලැසියර හා කඳු නිම්න ග්ලැසියර ක්‍රියාකාරිත්වයන් අතර කැපී පෙනෙන වෙනස්කම් **තුනක්** නිදසුන් ඇසුරින් සාකච්ඡා කරන්න. (ල.6)

iii. නිම්න ග්ලැසියර් ප්‍රදේශ ආශ්‍රිතව ඛාදන ක්‍රියාවලිය සිදුවන ආකාර **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.6)

iv. මහාද්වීපික ග්ලැසියර ප්‍රදේශවල නිධි සාදනයෙන් නිර්මාණය වන භූ රූප **තුනක්** සුදුසු රූප සටහන් සහිත ව පැහැදිලි කරන්න. (ල.6)

3).i. කාලගුණික මූලිකාංග යන්න හඳුන්වන්න. (ල.2)

ii. කාලගුණික මූලිකාංගයක් වන උෂ්ණත්වයේ සිරස් හා තිරස් ව්‍යාප්තිය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.6)

iii. අපරවර්තීගෝලය තුල ඇති ඕසෝන් ස්ථරය ක්ෂයවීම නිසා මිනිසාට හා පරිසරයට සිදුවන අහිතකර ප්‍රතිඵල **තුනක්** සාකච්ඡා කරන්න. (ල.6)

iv. ගෝලීය වශයෙන් සිදුවන දේශගුණික වෙනස්වීම්වල තීව්‍රතාවය අවමකර ගැනීමට මිනිසාට දායක විය හැකි ආකාරය කරුණු **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ල.6)

4).i. පරිසර පද්ධතිය හා බියෝමය අතර වෙනස පැහැදිලි කරන්න. (ල.2)

ii. කාන්තාර බියෝමය හා තුන්ද්‍රා බියෝමය තුළ හඳුනා ගත හැකි කැපී පෙනෙන වෙනස්කම් පහත තේමා යටතේ පැහැදිලි කරන්න.

a.ව්‍යාප්ති ප්‍රෙද්ශ

b.දේශගුණික ලක්ෂණ

c.ශාක හා සත්ත්ව විශේෂවල ලක්ෂණ (ල.6)


iii. කාන්තාරීකරණය කෙරෙහි බලපාන සාධක **තුනක්** නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න. (ල.6)

iv. ශ්‍රී ලංකාවේ වනාන්තර හායනයට දායක වන ස්වභාවික හා මානුෂ බලපෑම් **තුනක්** නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න. (ල.6)

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

# II කොටස - මානුෂ භූගෝල විද්‍යාව

5).




මූලාශ්‍රය : Department of Census and Statistics, Census of Population and Projection made by the Author

i. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා වර්ධනයේ කාලීන වෙනස්කම් **තුනක්** ඉහත ප්‍රස්තාරය ඇසුරින් ලියා දක්වන්න. (ල.3)

ii. ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධනයේ කාලීන වෙනස්කම් සඳහා බලපාන පහත සාධකවල වෙනස්කම් නිදසුන් ඇසුරින් සාකච්ඡා කරන්න. (ල.6)

a. සාඵල්‍යතාවය
b. මර්ත්‍යතාවය
c. සංක්‍රමණ (ල.6)

iii. අභ්‍යන්තර සංක්‍රමණ ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධන ක්‍රියාවලියට දායක වන ආකාරය කරුණු **තුනක්** මගින් පැහැදිලි කරන්න. (ල.6)

iv. ග්‍රාමීය නාගරික සංක්‍රමණ නිසා නාගරික ප්‍රදේශ ආශ්‍රිත ව පැන නැගී ඇති ගැටළු **තුනක්** සාකච්ඡා කරන්න. (ල.6)

6).i. ජනාවාසයක හඳුනාගත හැකි සංරචක **හතරක්** නම් කරන්න. (ල.2)

ii. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජනාවාස වර්ග **තුනක** දැකිය හැකි ලක්ෂණ කෙටියෙන් විස්තර කරන්න. (ල.6)

iii. ශ්‍රී ලංකාවේ නාගරික ජනාවාස ආශ්‍රිත ව නාගරික අපද්‍රව්‍ය සම්බන්ධයෙන් මතුව ඇති ගැටළු **තුනක්** කෙටියෙන් සාකච්ඡා කරන්න. (ල.6)

iv. ශ්‍රී ලංකාවේ නාගරිකරණය ආශ්‍රිත ගැටළු විසඳීමට රජය ගෙන ඇති ක්‍රියාමාර්ග **තුනක්** නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.6)

7).i. කර්මාන්ත ස්ථාන ගතවීමට බලපාන සාම්ප්‍රදායික සාධකයන් හා නූතන සාධකයක් බැගින් නම් කරන්න. (ල.2)

ii. ශ්‍රී ලංකාවේ සිමෙන්ති නිෂ්පාදන කර්මාන්තය ස්ථාන ගතවීමට බලපා ඇති සාධකවල යෝග්‍යතාවය පහත සාධක ඇසුරින් පැහැදිලි කරන්න.

a. අමු ද්‍රව්‍ය
b. ප්‍රවාහනය
c. වෙළඳපොළ (ල.6)

iii. නිෂ්පාදන කර්මාන්ත ආශ්‍රිතව ශ්‍රී ලංකාවට ඇති ආර්ථිකමය බලපෑම් **තුනක්** නිදසුන් ඇසුරින් විස්තර කරන්න. (ල.6)

iv. කර්මාන්ත ස්ථානගත වීමේදී දැකිය හැකි මෑත කාලීන ප්‍රවණතා **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ල.6)

8).i. ගෝලීයකරණ ක්‍රියාවලියේ ප්‍රධාන වාහක නම් කරන්න. (ල.2)

ii. ගෝලීයකරණයේ කැපී පෙනෙන ගති ලක්ෂණ **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.6)

iii. ගෝලීයකරණ ක්‍රියාවලිය මගින් ශ්‍රී ලංකාවට ඇතිවන යහපත් බලපෑම් **තුනක්** සාකච්ඡා කරන්න. (ල.6)

iv. ගෝලීයකරණ ක්‍රියාවලියේ දී බහු ජාතික සමාගම්වල මැදිහත්වීම නිසා සංවර්ධනය වෙමින් පවතින රටවල් මුහුණ දෙන අභියෝග **තුනක්** පැහැදිලි කරන්න. (ල.6)

PAST PAPERS WIKI



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක
# පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න






කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සිතාර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

## සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**